හිතවත් ගණුදෙනුකාර හවතුනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ගණුදෙනුකාර/පාරිභෝගික හවතුන්ගේ ප්‍රඥප්තිය යටතේ සපුරාලිය යුතු අවශ්‍යතාවකට අනුව, අප විසින් බැංකු කටයුතු ආශ්‍රිත මූලික කරුණු අඩංගු ලේඛන මාලාවක් සකස් කර ඇති අතර, අප විසින් පිරිනමන සහ ඔබට අවශ්‍ය වන සහ ඔබට සුදුසු වන බැංකු ගිණුම් වර්ග/බැංකු සේවාවන් තෝරාගැනීම සඳහා ඔබට සහායවීම පිණිස එකී ලේඛන මාලාවෙන් අපේක්ෂා කරනු ලැබේ.

පෞද්ගලික බැංකුකරණ කටයුතු සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් හී තිබෙන විවිධ වර්ගයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම්, විශේෂිත පැකේජ ආශ්‍රිත ගිණුම් සහ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් යනාදිය පිළිබඳව පුළුල් අන්දමේ කෙටි විස්තරයක් අප විසින්. මෙම බැංකු කටයුතු ආශ්‍රිත මූලික කරුණු අඩංගු ලේඛන මාලාව හරහා ඔබ වෙත ලබාදීමට කටයුතු කරනු ලැබේ.

එසේ වුව ද, මෙම බැංකු කටයුතු ආශ්‍රිත මූලික කරුණු අඩංගු ලේඛන මාලාවේ සඳහන් පහත දැක්වෙන කරුණු නෛතික සහ නියාමන වෙනස්කම්වලට අනුව සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිවල සිදුවන වෙනස්කම්වලට අනුව ප්‍රතිශෝධනය කිරීම අවශ්‍ය වන බව කාරුණිකව මතක තබාගන්න.

මේ පිළිබඳව ඔබට තවදුරටත් තොරතුරු දැනගැනීමට අවශ්‍ය වන්නේ නම් කරුණාකර අපගේ විද්‍යුත් තැපැල වන www.nationstrust.com ඔස්සේ හෝ දුරකථනය අංක 011 4 711 411 ඔස්සේ පැය 24 පුරා ක්‍රියාත්මක අපගේ ඇමතුම් මධ්‍යස්ථානය අමතන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මෙහි පහත සඳහන් ඔබගේ යම් කවර ම වූ ගිණුමක් සම්බන්ධයෙන් ඔබට යම් පැමිණිල්ලක් වෙතොත්, එකී පැමිණිල්ල පිළිබඳව දන්වමින් කෙටි ලිඛිත ප්‍රකාශයක් **පැමිණිලි විභාග කිරීමේ නිලධාරි, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02** යන ලිපිනය වෙත ඉදිරිපත් කරන ලෙස හෝ අංක [+ 94(0)11 4711411] දරන දුරකථනය ඔස්සේ අප අමතන ලෙස/අපගේ විද්‍යුත් තැපැල වන customerservice@nationstrust.com ඔස්සේ අප අමතන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර, අප විසින් ඔබට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමට කටයුතු කරනු ලැබේ.

| ගිණුම පිළිබඳ විස්තරය | ගණුදෙනුකාරභවතුන් සඳහා ප්‍රතිලාභ | ගාස්තු වර්ග සහ බැංකුවේ වෙනත් අයකිරීම් | ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| අ) නේෂන්ස් ප්‍රබුද්ධ ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරිකිරීමේ ගිණුම | | | | |
| වයස අවුරුදු 60 ඉක්මවූ තනි පුද්ගලයන් සඳහා පොලී අනුපාත වරණයන් සහිතව විශේෂයෙන්ම සැලසුම්කර ඇති පොලිය ජනිත වන ගිණුම් විශේෂයකි. | * රුපියල් 5,000 කට වැඩිවන ශේෂය සඳහා වර්ෂයකට 4.0%)ක ඉහළ පොලී අනුපාතය. (වා.ස.පො.අ. 4.0742%)<br>* ගිණුමට මාරුකරන මාසික විශ්‍රාම වැටුප මෙන් උපරිම වශයෙන් 15 ගුණයක් දක්වා ණය පහසුකම්.<br>* ගිණුමේ ශේෂය මත අයිරා පහසුකම්.<br>* ණයපත් පහසුකම්.<br>* නේෂන්ස් මාස්ටර් ෂොපින් ඩෙබිට් කාඩ්පත.<br>* කවුන්ටරයෙන් බැහැර මුදල් ආපසු ගැනීමේ දී ගාස්තු අය නොකිරීම<br>* බැංකු සේවාව ඔබේ නිවසටම | * ගිණුමේ අවම මාසික සාමාන්‍ය ශේෂය ශ්‍රී ලංකා රුපියල් 1000/- කට අඩු වුවහොත් රුපියල් 50/- ක ගාස්තුවක් අය කෙරේ.<br>* ගිණුම වසා දැමීමේ ගාස්තු<br>* සියලුම බැංකු පහසුකම් සඳහා සම්මත ගාස්තු අදාල කරගැනීම | ඉතිරිකිරීමේ ගිණුම් සඳහා ගිණුම් විවෘත කිරීමේ බැංකුවේ සම්මත ආකෘතිපත්‍ර සම්පූර්ණ කොට, බැංකුවේ ඕනෑම ශාඛාවකට ඉදිරිපත් කළයුතු අතර, එකී ආකෘතිය සමග පහත සඳහන් ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.<br>* ජාතික හැඳුනුම් පතේ / වලංගු ගමන් බලපත්‍රයේ පිටපතක්<br>* පදිංචි ලිපිනය ජාතික හැඳුනුම්පතේ හෝ ගමන් බලපත්‍රයේ ලිපිනයට වෙනස් වන්නේ නම්, ලිපිනයේ නිරවද්‍යතාව තහවුරු කිරීම පිණිස ලේඛනමය සාක්ෂි අවශ්‍ය වේ. | * **සුදුසුකම් ලබන තැනැත්තන්:**<br><br>ජාතික හැඳුනුම්පතක්/ වලංගු ගමන් බලපත්‍රයක් දරන, ශ්‍රී ලංකාවේ පදිංචි, වයස අවුරුදු 60 ඉක්ම වූ ශ්‍රී ලාංකික පුරවැසියන්<br><br>වලංගු නේවාසික වීසාවක් දරන, වයස අවු 60 ඉක්ම වූ ශ්‍රී ලාංකික නොවන පුරවැසියන් |

| **ගිණුම පිළිබඳ විස්තරය** | **ගණුදෙනුකාරභවතුන් සඳහා ප්‍රතිලාභ** | **ගාස්තු වර්ග සහ බැංකුවේ වෙනත් අයකිරීම්** | **ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය** | **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** |
|---|---|---|---|---|
| අ) නේෂන්ස් ප්‍රබුද්ධ ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පතු | | | | |
| ඕෂසිකව හෝ කල්පිරීමේදී පොලියක් පිරිනමන දේශීය ව්‍යවහාර ස්ථාවර තැන්පතු ගිණුමක් වේ. | * අසාධ්‍ය තත්වයේ හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා, කරුණු සනාථ කිරීම මත කල්පිරීමට පෙර පොලිය අඩුකිරීමකින් තොරව ස්ථාවර තැන්පතු මුදල ලබාගැනීම | * සියලුම බැංකු පහසුකම් සඳහා සම්මත ගාස්තු අදාල කරගැනීම | ඉතිරිකිරීමේ ගිණුම් සඳහා ගිණුම් විවෘත කිරීමේ බැංකුවේ සම්මත ආකෘතිපත්‍ර සම්පූර්ණ කොට, බැංකුවේ ඕනෑම ශාඛාවකට ඉදිරිපත් කළයුතු අතර, එකී ආකෘතිය සමග පහත සඳහන් ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.<br>* ජාතික හැඳුනුම් පතේ / වලංගු ගමන් බලපත්‍රයේ පිටපතක්<br>* පදිංචි ලිපිනය ජාතික හැඳුනුම්පතේ හෝ ගමන් බලපත්‍රයේ ලිපිනයට වෙනස් වන්නේ නම්, ලිපිනයේ නිරවද්‍යතාව තහවුරු කිරීම පිණිස ලේඛනමය සාක්ෂි අවශ්‍ය වේ. | * **සුදුසුකම් ලබන තැනැත්තන්:**<br><br>ජාතික හැඳුනුම්පතක්/ වලංගු ගමන් බලපත්‍රයක් දරන, ශ්‍රී ලංකාවේ පදිංචි, වයස අවුරුදු 60 ඉක්ම වූ ශ්‍රී ලාංකික පුරවැසියන්<br><br>වලංගු නේවාසික වීසාවක් දරන, වයස අවු 60 ඉක්ම වූ ශ්‍රී ලාංකික නොවන පුරවැසියන් |